# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2308/22 - 2022 නොවැම්බර් මස 30 වැනි බදාදා - 2022.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියෙහි 129(1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියෙහි 129(1) වන උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද මෙහි පහත සඳහන් නියෝග මෙයින් ප්‍රකාශයට පත් කරන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී,
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා),
එන්ඩීසී පීඑස්සී,
මාෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නියෝගය

1. මෙම නියෝගය ක්‍රියාත්මක වන දිනට පූර්වයෙන් බස්නාහිර පළාතේ අංක 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011 නොවැම්බර් මස 03 වන දිනැති අංක 1730/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදී ඇති 2011 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග හා 2013 අප්‍රේල් මස 30 වන දිනැති අංක 1808/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදී ඇති 2013 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග යටතේ කුමක් සඳහන් වුව ද මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රවාහන අමාත්‍යවරයා විසින් මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය යටතේ සාදන ලදුව 2022 නොවැම්බර් මස 14 වන දිනැති අංක 2306/02 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදී ඇති නියෝග යටතේ vi, vii උපලේඛන හා ix උපලේඛනයෙහි 12 හා 13 වගන්ති යටතේ වන ගාස්තු බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළව ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් විය යුතු ය.

2. මෙම නියෝගයන්හි සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හට ගනී නම් සිංහල පාඨය බල පැවැත්විය යුතු ය.

EOG 11-0349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.